ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජුලි 2017

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

### A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

මුළු ලකුණු 20 ක් හිමි අනිවාර්ය ප්‍රශ්න 8 කි. උසස් මූල්‍ය ගිණුම්කරණය විෂය ආවරණය වන පරිදි ප්‍රශ්න යොමු කරමින් දැනුම විමසීමට ලක්ව ඇත. වගකීම සීමිත සමාගම් පිළිබඳ අවබෝධය, හවුල් ව්‍යාපාර ආඥා පනත පිළිබඳ අවබෝධය, ලාභ අරමුණු කර නොගත් සංවිධාන, වෙළෙඳ ගිණුම් පිළිබඳ අවබෝධය, වත්කමක්, ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කිරීම, කේවලස්වාමි ව්‍යාපාර ගිණුම් පිළියෙල කිරීම, හවුල්කරුවෙකු විශ්‍රාම යාමේදී ලාභ අනුපාත ගණනය සහ එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුම් සම්බන්ධ දැනුම හා ඒ පිළිබඳ මූලික අවබෝධය විමසා බැලීමට ප්‍රශ්න යොමුව තිබේ.

සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා ඇත. 1.2 ප්‍රශ්නයෙහි 1890 හවුල් ව්‍යාපාර පනතෙහි විධිවිධාන සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම ඉතාම දුර්වලය. වත්කම් හඳුනාගැනීම සහ ජංගම වත්කම් වර්ගීකරණයට අදාල නිර්ණායක පිළිබඳ යොමුකර ඇති 1.5 ප්‍රශ්නයට නිවැරදි උත්තර වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් විසින් සපයා නැත. ප්‍රශ්න කියවා අවබෝධ කර නොගැනීම නිසා මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තර ඍජුවම සැපයීමට බහුතරයකට නොහැකිව තිබේ. 1.6 ප්‍රශ්නයෙහි වසර මුල සහ අග, මූල්‍ය තොරතුරු පදනම් කරගෙන ලාභ ගණනය සම්බන්ධයෙන් ඇති දැනුම සහ ගිණුම්කරණ සමීකරණය පිළිබඳ දැනුමද දුර්වල මට්ටමක වේ. සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් එකතුකළ අගය මත බදු ඇතුලත්ව සහ එකතුකළ අගය මත බදු නොමැතිව යන්න නිවැරදිව හඳුනාගෙන 1.8 ප්‍රශ්නය සඳහා උත්තර සපයා නැත. එහෙයින් ඒ සම්බන්ධ සටහන් එකතුකළ අගය මත බදු (VAT), පාලන ගිණුමෙහි නිවැරදිව ඉදිරිපත් කිරීමට බොහෝ අයදුම්කරුවන් සමත්ව නැත. පළමු ප්‍රශ්නයට ලකුණු ශූන්‍ය අයදුම්කරුවන් අතලොස්සක් ද විය. පොදුවේ අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු රැස්කරගැනීමට වැඩිදෙනෙක් සමත් විය. විෂය නිර්දේශයට අනුකූලව දැනුම වර්ධනය කර ගැනීමෙන් සහ ස්ව-අධ්‍යයන පොත් පරිශීලනය කිරීමෙන්, තම දැනුම තහවුරු කරගෙන වැඩි ලකුණු ලබාගැනීමට අයදුම්කරුවන් උනන්දු විය යුතුය.

.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)
(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

ප්‍රත්‍යාගණනය සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් තැබීම අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වේ. ඇතැම් අයදුම්කරුවන් ලකුණු හිමි නොවන ලෙජර් ගිණුම් ඉදිරිපත් කිරීමට පෙළඹී උත්තර සැපයීමට තිබූ කාලය අපතේ හැර ඇත. වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් පහසුවෙන් මුළු ලකුණු ලබා ගැනීමට සමත්ව ඇත. ප්‍රශ්නය හොඳින් කියවා උත්තර නොසැපයීම නිසා ප්‍රශ්නයෙන් කොටසකට පමණක් උත්තර සපයා තිබූ අයදුම්කරුවන් ද විය. සමුච්චිත ක්ෂය පිළිබඳව බොහෝ අයදුම්කරුවන් අවධානය යොමු නොකිරීම නිසා ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව ලබාගෙන නැත. ලාභය නිවැරදිව පැරණි හවුල්කරුවන්ට අනුපාතිකව බෙදා නොකිරීම නිසාද සමහර අයදුම්කරුවන්ට ලකුණු අහිමි විය. ඉවත්ව යන හවුල්කරුට අදාල ප්‍රත්‍යාගණන ලාභය ගණනය කර නොපෙන්වීම නිසාද සමහර අයදුම්කරුවන්ට මුළු ලකුණු ලැබීමට නොහැකි විය. ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කිරීම නිසාද නිවැරදි අවබෝධයෙන් ජර්නල් සටහන් නොතැබීම නිසාද, සමහර අයදුම්කරුවන්ට ලකුණු අහිමි විය. ප්‍රත්‍යාගණන ලාභය ප්‍රාග්ධන ගිණුමට ගලපනු වෙනුවට ජංගම ගිණුමට ගැලපීම නිසාද නියමිත ලකුණු ලබාගැනීමට නොහැකිවූ අයදුම්කරුවන්ද විය.

### ප්‍රශ්න අංක 03

බැංකු සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් යොමුවූන මෙම ප්‍රශ්නය සඳහා 2017 මාර්තු 31 දිනට ගලපන ලද මුදල් පොත සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන් වැඩි දෙනෙක් සාර්ථකව උත්තර දී මුළු ලකුණු ලබාගෙන ඇත. ඇතැම් අයදුම්කරුවන් ගලපන ලද මුදල් පොතට අදාල සටහන් හඳුනා නොගැනීම නිසා ඒ සඳහා වෙන්කළ ලකුණු නොලැබීම සිදුවිය. එම අයදුම්කරුවන් මුදල් පොතේ ශේෂය ගැලපීමට අදාල නිවැරදි සටහන් හඳුනා ගැනීමට අසමත්ව තිබුණු අතර, එම ගැලපීම් බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ දක්වා තිබුණි. සමහර අයදුම්කරුවන් මේ සම්බන්ධව මූලික න්‍යායික දැනුම තහවුරු කරගෙන නැත. සමහර අයදුම්කරුවන් එකතු කළ යුතු අයිතම අඩු කිරීම් ලෙසත් අඩුකළ යුතු අයිතම එකතු කිරීම් ලෙසත් දක්වා තිබුණි.

### ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය තුළින් වැටුප් ගිණුම සහ සම්බන්ධ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවකයන්ගේ භාරකාර අරමුදල (ETF) පිළිබඳ දැනුම විමසා බලා ඇත. ඒ ඇසුරින් දී ඇති සටහන්වලට අදාල ජර්නල් සටහන්, මුදල් ගනුදෙනුවලට අදාල සටහන්ද ඇතුළුව පිළියෙල කිරීමට බලාපොරොත්තු විය. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා මුළු ලකුණු ලබාගෙන තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් ඉදිරිපත් කර තිබුණි. මුදල් ගනුදෙනුවලට අදාල ජර්නල් සටහන් නොතැබීමෙන් ලකුණු අහිමිකරගෙන තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක 05

(a) කොටස සඳහා යන්ත්‍රය වැඩි දියුණු කිරීමට අදාල ගැලපීම් සටහන් කිරීමෙන් පසු 2016 අප්‍රේල් 01 දිනට යන්ත්‍ර ගිණුමේ දැක්වෙන පිරිවැය සහ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රය වෙනුවෙන් අයකළ යුතු ක්ෂය ගණනය කිරීම අවශ්‍ය විය. වැරදි ලෙස තීරුබදු සහ නිෂ්කාශන වියදම්, සවිකිරීමේ පිරිවැය යන්ත්‍රයේ ගැනුම් මිලෙන් අඩුකළ අයදුම්කරුවන් ද විය. වැඩිදියුණු කිරීමේ පිරිවැය එකතුකර නොතිබූ අවස්ථාද විය. (b) කොටස සඳහා ක්ෂය ගැලපීම නිවැරදිව කර නැත. අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයුකාලය නිවැරදිව යොදා ගැනීමට අසමත්ව තිබූ බැවින් ලකුණු නොලැබී ගිය අවස්ථාද විය. මෙහිදී යන්ත්‍රය වෙනුවෙන් වර්ෂය සඳහා අයදුම්කරුවන් කළ යුතු ක්ෂය ගණන් බැලීමේදී අදාළ වන සමුච්චිත ක්ෂය ප්‍රමාණය ගණනය කර, එය අඩුකිරීමෙන්ද, වැඩිදියුණු කිරීමේ පිරිවැය එකතු කිරීමෙන්ද වර්ෂය ආරම්භයේ නිවැරදි ධාරණ අගය ලබාගත යුතුය. ඉන්පසුව එම ධාරණ අගයෙන් අවශේෂ වටිනාකම අඩුකර ඉතිරි ප්‍රයෝජනවත් ආයුකාලයෙන් බෙදීමෙන් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රය වෙනුවෙන් අයකළ යුතු ක්ෂය ගණනය කරගත හැකි බව අයදුම්කරුවන් අවබෝධ කරගත යුතුය. අයදුම්කරුවන් විසින් මේ සම්බන්ධව න්‍යායාත්මක දැනුම වැඩිදියුණු කරගත යුතුය.

## ප්‍රශ්න අංක 06

මෙය වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් මුළු ලකුණු ලබාගත් ප්‍රශ්නයයි. ණයගැති පාලන ගිණුම සහ ණයහිමි පාලන ගිණුම පිළියෙල කිරීම වෙනුවෙන් ලකුණු වෙන්කර ඇත. සමහර අයදුම්කරුවන් සටහන් නිවැරදිව හඳුනා නොගැනීම නිසා සහ පාලන ගිණුමේ ආරම්භක ශේෂයන් වල සහ ගනුදෙනු සටහන් කිරීමේදී හර සහ බැර නිවැරදිව හඳුනා නොගෙන මාරුකර සටහන් කිරීම නිසාද ලකුණු නොලැබී තිබූ අවස්ථා තිබුණි.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

කේවලස්වාමි ව්‍යාපාරයක මූල්‍ය දත්ත ආශ්‍රයෙන් ශේෂ පිරික්සුම පිළියෙල කර, වෙන්කළ ලකුණු 10 ලබා ගැනීමට හැකියාව තිබුණි. ආරම්භක ප්‍රාග්ධන ශේෂය නිවැරදිව හඳුනාගැනීමට සමහර අයදුම්කරුවන් සමත්ව නැත. සමහර අයදුම්කරුවන් වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුම සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් ගිණුම් පිළියෙල කර, විකුණුම් සහ ගැනුම් සෙවීමට උත්සුක වී නැත. ශේෂ පිරික්සුම වෙනුවට සමහර අයදුම්කරුවන් ශේෂ පත්‍රය පිළියෙල කර ඇත. මුළු ලකුණු ලබාගත් ප්‍රතිශතය ප්‍රශස්ථ මට්ටමක විය. ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමට උත්සාහ කර නැත. මෙම ප්‍රශ්නය සඳහා වර්ෂය මුල ප්‍රාග්ධනය ගණනය කොට, වෙළෙඳ ලැබිය යුතු මුදල් , වෙළෙඳ ගෙවිය යුතු මුදල්, බැංකු ගිණුම සහ විදුලිය ගිණුම පිළියෙල කර නිවැරදි ශේෂ සොයාගෙන, ආරම්භක ශේෂ ගළපා නිවැරදි දත්ත ලබාගෙන ශේෂ පිරික්සුම පිළියෙල කළ යුතු වේ. සමහර අයදුම්කරුවන් වෙළෙඳ හා ලාභා'ලාභ ගිණුම පිළියෙල කර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. ශේෂ පිරික්සුම සඳහා අදාල ආකෘතිය භාවිත නොකළ අයදුම්කරුවන්ද විය. නිවැරදිව තේරුම්ගෙන නියමිත ආකාරයට ශේෂ ලෙජර් ගිණුම්වලින් උපුටා දැක්වීම තුලින් මූලික ගිණුම්කරණ දැනුම ඇති අයදුම්කරුවන්ට පහසුවෙන් ලකුණු ලැබිය හැකිව තිබූ ප්‍රශ්නයකි.

## ප්‍රශ්න අංක 08

හවුල් ව්‍යාපාරයක ලාභා'ලාභ විසර්ජන ගිණුම, හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කිරීමේ දැනුම විමසා ඇත. සමහර අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබාගැනීමට සමත්ව ඇත. එහෙත් ඇතැම් අයදුම්කරුවන් ජංගම ගිණුම පිළියෙල කිරීම සඳහා අවශ්‍ය සටහන් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. හවුල්කරුවන්ට අදාල ප්‍රාග්ධන පොලී නිවැරදිව ජංගම ගිණුම් තුළ සටහන් නොකිරීම මෙන්ම, ලාභා'ලාභ විසර්ජනය කිරීමේදී අදාල අනුපාත නිවැරදිව යොදා නොගැනීම වැනි වැරදි දක්නට විය. කීර්තිනාමය ගැලපීමට අදාල සටහන් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ පෙන්වා නොමැති අවස්ථා ද දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් කීර්තිනාමයට අදාල ගැලපීම් ජංගම ගිණුම තුලින් ගැලපීම නිසා ලකුණු අහිමි විය. සංඛ්‍යා දහස් ගණනින් ('000) දැක්වීමට අවධානය යොමු නොවීම නිසා සීමිත අයදුම්කරුවන් පිරිසකගේ උත්තර තුළ අංක ගණිතමය වැරදි සිදුකර තිබුණි. ප්‍රාග්ධන පොලී නිවැරදිව ගණන් බැලීමට අසමත් අයදුම්කරුවන් ද විය.

## ප්‍රශ්න අංක 09

පිහිනුම් සමාජයක වර්ෂය අවසානයේ ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කිරීමට අවශ්‍යව තිබුණි. ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම් සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම දියුණුකර ගත යුතුවේ. සාමාජික මුදල්, අත්තිකාරම්, සහ හිඟ සාමාජික මුදල් සහ වර්ෂයට අදාල සාමාජික මුදල් නිවැරදිව ගණනය කිරීමට අයදුම්කරුවන්ගේ අවධානය යොමුකළ යුතුය. උත්තර සපයන ලද අයදුම්කරුවන් ලබාගත් ලකුණු ප්‍රශස්ථ මට්ටමක පැවතුණි. සාමාජික මුදල් ගණනය සරල වුවත් එය නිවැරදිව ගණනය කර පෙන්වීමට සමහර අයදුම්කරුවන් අසමත්ව ඇත. හර, බැර සටහන් නිවැරදි ආකෘතියට නොදැක්වීමෙන් ලකුණු නොලැබී ගිය අවස්ථා විය. සමහර අයදුම්කරුවන් පෙරවැඩ පැහැදිලිව ඉදිරිපත් කර නැත. ඉතා සරල ප්‍රශ්නයක් වූ මෙම ප්‍රශ්නයට උත්තර සැපයීම අත්හැර දමා තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සීමාසහිත පෞද්ගලික සමාගම් සම්බන්ධයෙන් කළමනාකරණයේ භාවිතය සඳහා වර්ෂය අවසානයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට අවශ්‍ය විය. ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම, ද්විත්ව සටහන්, සංකල්ප පිළිබඳ දැනුම විමසීමට යොමු වූ ප්‍රශ්නයක් වේ. සමස්තයක් වශයෙන් සමාගම් ගිණුම් පිළිබඳ දැනුම විමසීමට ඉදිරිපත් කර ඇති සරල ගැටළු ඇතුලත්ව තිබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය නිවැරදි ආකෘතියට ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කෙරෙහි අවධානය යොමුවිය යුතුය. යල්පැන ගිය තොග හා ණයකර පොලී සම්බන්ධ ගැටළුවලට අදාල ගැලපුම් සටහන් සමහර අයදුම්කරුවන් නිවැරදිව විසඳා නැත.

වෙළෙඳ ලැබිය යුතු මුදල් වලින්, බුන්වත් බවට පත්වූ ගනුදෙනුකරුවෙකුට අදාල ලැබිය යුතු මුදල අඩුකර නොදැක්වූ අයදුම්කරුවන්ද විය. මෙම නිසා 5% ලැබිය යුතු මුදල් සඳහා දීමනාවද වැරදි ලෙස ගණනය කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි. බැංකු අයිරාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ නිවැරදිව පෙන්වා නැති අවස්ථා විය. ආදායම් බදු ගැලපුම නිවැරදිව කිරීමට සමහර අයදුම්කරුවන් සමත්ව නැත. උපචිත සහ කලින් ගෙවූ වියදම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අදාල සටහන් නිවැරදි ස්ථානවල දැක්වීමට හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අයත් සටහන් නිසිපරිදි ගලපා ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය. මේ සම්බන්ධයෙන් පෙරවැඩ නිවැරදිව කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අවශ්‍ය අගය නිසි පරිදි පෙන්වූ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් විය. ක්ෂය වීම් නිවැරදිව ගණනය කර ගැලපීමට බොහෝ දෙනෙක් සමත්ව ඇත. කාල කළමනාකරණය සැලකිල්ලට ගෙන, ඉල්ලා ඇති තොරතුරු ලබා දීම ලකුණු රැස්කිරීමට හේතු වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය නිවැරදි ආකෘතියට ඉදිරිපත් කිරීම, සටහන් නියමිත ස්ථානවල දැක්වීම කෙරෙහි අයදුම්කරුවන් අවධානය යොමුකළ යුතුය.

**පොදු කරුණු:**

මූලික ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත සමාගම් පනත පිළිබඳ අවබෝධය ලබාගත යුතුය. ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී පිටු වෙන්කර, ප්‍රශ්න අංක නිවැරදිව යෙදීම (ඇතැම් අයදුම්කරුවන් පිටු අංක කිරීම, ප්‍රශ්න අංක ලෙස දක්වයි), උත්තර ආසන්නයෙන්ම අදාල පෙරවැඩ පෙන්වීම හා ප්‍රශ්නයේ කොටස් තැනින් තැන වෙනත් පිටුවල පෙන්වීමෙන් වැළකීම, එසේ පෙන්වීමට සිදුවන අවස්ථාවල සටහනකින් අදාල පිටුවට අවධානය යොමු කරවීම වැදගත් වේ. සෑම විටම දී ඇති උපදෙස් අනුගමනය කර ඒ අනුව උත්තර සැපයිය යුතුය.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු පොදු කරුණු</u>:**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් ප්‍රවේශමෙන් ප්‍රශ්නය කිප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා සෘජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත්, ලිපි සඟරා ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

\- * * * -